දරුවන් උදෙසා
බයිබලයක්

# මිනිසාගේ දුකෙහි පටන්ගැන්ම



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus

සකස්කරන්නා: M. Maillot; Tammy S.

අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2012 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.


දෙවියන් වහන්සේ සියලු දේ මැවූ සේක.
පළමු මිනිසා වන ආදම් සහ ඔහුගේ බිරිඳ
වන ඒව ද මැවූ සේක. ඔවුහු ඒදන් උයනෙහි
දෙවියන් වහන්සේට කීකරුව ඉතා ප්‍රීතියෙන්
ජීවත් වූහ. එක් දවසක් දා ...



''සෑම ගසකින්ම
කන්න එපා කියා
දෙවියන් වහන්සේ ඔබට
කීවා ද?'' සර්පයා එවගෙන්
ඇසුවා. ''එක ගසක පලතුරු හැර අන්
සියලු ගස්වල පලතුරු කෑමට හැකි ය.''
එව පිළිතුරු දුන්නා. ''එම පලතුර
කෑවොත් හෝ ඇල්ලුවොත්
අපි මැරෙයි'' එව කීවා. ''එය
බොරුවක්. ඔබ මැරෙන්නේ
නැහැ'' සර්පයා සිනාසෙමින්
කීවා.



’’ඔබ දෙවියන් වහන්සේ
වගේ වෙනවා’’ ඒවට
එම ගසේ පලතුරු
කෑමට අවශ්‍ය වුණා.
ඇය සර්පයාගේ වචන
අසා එම පලතුර කෑවා.

ඒව දෙවියන් වහන්සේට අකීකරු වූ
අතර ආදම්ට ද එම ගෙඩිය කෑමට
සැලැස්සුවා. ''බැහැ, මම දෙවියන්
වහන්සේගේ අණට අකීකරු
වෙන්නේ නැහැ''
යි ආදම්ට
කියන්න
තිබුණා.





ආදම්
සහ ඒව දෙවියන්
වහන්සේගේ අණට අකිකරු වී පව් කළායින්
පසු ඔවුනට තේරුම් ගියා, ඔවුන් නිරුවත් බව. අත්තික්කා
කොළවලින් ඇඳුම් මසාගෙන තම නිරුවත් බව වසාගෙන
දෙවියන් වහන්සේගෙන් සැඟවිලා ගස් අතර සිටියා.



සවස් කාලයේදී දෙවියන් වහන්සේ
උයනට පැමිණි සේක. ආදම් සහ
ඒව කළ ඇති දෙය උන් වහන්සේ
දැනගත්තා. ආදම් සහ ඒව
වරදකරුවන් බවට පත්වුණා. ඒව
සර්පයා පිට වරද තැබුවා. ''සර්පයා
සාපලත් බවත්, කාන්තාව වේදනා
සහිතව දරුවන් බිහිකරන
බවත්'' දෙවියන්
වහන්සේ වදාළ
සේක.

ආදම්, ඔබත් පව් කළ නිසා පොළොව ශාපයට ලක් වේ. එහි කටු ද විෂ සහිත ගස් ද පවතිනු ඇත. ඔබගේ දිනපතා ආහාරය සඳහා ඉතා මහන්සි වී වැඩ කිරීමට ඔබට සිදුවනු ඇත.





දෙවියන් වහන්සේ ආදම් සහ ඒව
උයනෙන් පිටතට යැවූ සේක. ඔවුන්
දෙවියන් වහන්සේට අකීකරු වූ
නිසා දෙවියන් වහන්සේගේ
සදාකාල ජීවනයෙන්
ඈත් වුණා.


දෙවියන් වහන්සේ
ඔවුන් පිටත තැබීම සඳහා ගිනිමය
කඩුවක් සෑදු සේක. ආදම් සහ ඒව
සඳහා සම්වලින් ඇඳුමක් සාදා දුන්
සේක. දෙවියන්
වහන්සේ සම්
සොයාගත්තේ
කෙසේද?

කල්ගත වෙත්ම ආදම් සහ ඒව පවුලක් බවට පත්වුණා. ඔවුන්ගේ වැඩිමහල් පුතා කායින්, වගාකරන්නකු වූ අතර දෙවන පුත්, ආබෙල් එඬේරෙක් විය.



එක දවසක් කායින් තම බෝග රැගෙන දෙවියන් වහන්සේට පූජා කළා. ආබෙල් ඔහුගේ බැටළු රැළෙන් හොඳම බැටළුවා රැගෙන දෙවියන් වහන්සේට පූජා කළා. දෙවියන් වහන්සේ ආබෙල්ගේ පූජාවට සතුටු වුණා.



දෙවියන් වහන්සේ කායින්ගේ පූජාව ගැන සතුටු වුණේ නැහැ. කායින්ට දරාගත නොහැකි ආකාරයට කේන්ති ගියා.



කායින්ගේ කේන්තිය ඔහුගෙන් ඉවත් වුණේ නැහැ. ටික කලකට පසු ඔහු කෙතේ දී ආබෙල්ට පහර දී ඔහු මරා දැමුවා.



''ඔබේ සහෝදර ආබෙල් කොහේද?'' දෙවියන් වහන්සේ
කායින්ගෙන් ඇසුවා. ''මම දන්නේ නැහැ'' කායින් බොරු
කීවා. ''මම මගේ සහෝදරයාගේ රැකවලාදු'' යි කායින්
විමසුවා. දෙවියන් වහන්සේ, බෝග වගාව
සඳහා කායින් සතුව තිබූ හැකියාව, ඉවත්
කොට ඔහු ඔබමොබ යන්නෙක් බවට
පත් කළ සේක.



කායින් දෙවියන් වහන්සේගේ අභිමුඛයෙන් ඉවත් විය. ආදම් සහ ඒවගේ දියණියක් සමඟ විවාහ වී පවුලක් ලෙස වර්ධනය විය.



කායින්ගේ දරු මුණුබුරෝ ඉතා
ඉක්මණින් දේශය පුරා පැතිර ගියහ.



ආදම් සහ ඒව ඇතුළු පවුල ද ඉතා ඉක්මණින් වර්ධනය විය. එම අවධියේ ජනයා බොහෝ කාලයක් ජීවත් වූහ.



ඒව සෙත් බිහි කළ විට, ''දෙවියන් වහන්සේ ආබෙල් වෙනුවට මට සෙත් දුන් සේක'' යි කීවාය. සෙත් දෙවියන් වහන්සේට බොහෝ ලැදි මිනිසෙක් වූවා. ඔහු බොහෝ දරුැ මුණුබුරන් බිහිකොට වසර නවසිය දොළහක් දිවි ගෙව්වා.



ලොව පුරා මිනිස්සු පරපුරෙන්
පරපුරට දරුණු වුණා. අවසානයේ
දී සියල්ල විනාශ කිරීමට දෙවියන්
වහන්සේ තීරණය කළ සේක.
මනුෂ්‍යයන් ද ...



සියලුම සතුන් හා පක්ෂීන් : මනුෂ්‍යයා මැවීම පිළිබඳව දෙවියන් වහන්සේ දුක් වුණා. එහෙත් දෙවියන් වහන්සේ ප්‍රසන්න කිරීමට එක් මනුෂ්‍යයෙක් සමත් වුණා.





මේ මිනිසාගේ නම නෝවා. ඔහු
සෙත්ගෙන් පැවතෙන්නෙක්. ඔහු
ධර්මිෂ්ඨ මෙන්ම නිර්දෝෂී කෙනෙක්.
ඔහු දෙවියන් වහන්සේ සමග
හැසිරුණු කෙනෙක්.

ඔහු තමා මෙන් තම දරු තිදෙනාට ද දෙවියන් වහන්සේට කීකරු වීමට ඉගැන්නුවා.



# මිනිසාගේ දුකෙහි පටන්ගැන්ම

## දේව වචනයෙන් එක් කථාවක්

## බයිබලයේ

## උත්පත්ති 3-6

"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"
ගීතාවලිය 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වූ සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)